දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිරී යෑම සැබෑ තත්වයක් වන අතර, ඇතැම් විටක ආචාර ධර්මික ප්‍රවේශයකින් හෝ නිසි ප්‍රවේසම් සහගත බවකින් තොරව දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාකරණයද ඊට හේතුවක් වීමට ඉඩ ඇත. දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍ය ආචාර ධර්ම පිළිපැදීම අනිවාර්ය වන්නේ ඒ හෙයිනි.

රූපවාහිනී ප්‍රධාන පුවත් තුළ කරුවලගස්වැව දැරියක් දිවි තොර කරගැනීමේ ආසන්නතම සිදුවීමක් දෙසැම්බර් 30, 2021 දින වාර්තා කර තිබූ ආකාරයත් , ජංගම දුරකථන සහ බාලවයස්කාර ළමුන් සම්බන්ධයෙන් වන ලිපියක කරුවලගස්වැව දැරියගේ දිවි තොර කරගැනීම හා පසුගිය වසරේ මාතර දරුවෙක් දිවි තොර කරගැනීමේ සිදුවීම දක්වා තිබූ ආකාරයත් සැලකිල්ලට ගත හැක.

1) මෙහි දිවි තොර කරගත් ආකාරය ඉදිරිපත් කරයි. එය දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු අනුකාරක දිවි තොර කරගැනීම් වෙත යොමු වීමේ ප්‍රවණතාවයකට හේතු විය හැක.

2) දිවි තොර කරගත් අය ලියූ ලිපි පළ කර ඇත. එයද දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති තවත් අයෙකුට උත්ප්‍රේරකයක් වීමට හැක.

3) දිවි තොර කරගත් අයගේ ඡායාරූපය දක්වා ඇත. ඒ ඔස්සේ, එම දිවි තොර කරගැනීමේ සිදුවීම නිසාත්, දිවි තොර කරගැනීම් හා බැඳුනු සමාජ අගතිය නිසාත්, පවුලේ සාමාජිකයන් තුළ දැනටමත් ඇති වී තිබිය හැකි සිත් වේදනාවන් සහ මානසික පීඩාවන් තවදුරටත් වැඩිවර්ධනය විය හැක.

4) උපකාරක අංක සඳහන් කර නැත. හදිසි උපකාරක අංක සඳහන් වූයේ නම්, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයක් ඇති අයෙකු උපදේශන සේවාවන් වෙත යොමු වීමට ඉන් පෙළඹවීමක් ඇතිවීමට හා ඒ ඔස්සේ ජීවිතයක් ගලවා ගැනීමට ඉඩක් ලැබෙනු ඇත.

මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

හදිසි උපකාරක අංක:
CCCline - 1333
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)


මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Samaritans_Media...